# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 26 දරන ශ්‍රී ලංකා අක්ෂි පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1990 ජූලි මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. නැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1990 අංක 26 දරන ශ්‍රී ලංකා අක්ෂි පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 55/89.

**ශ්‍රී ලංකා අක්ෂි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**"ශ්‍රී ලංකා අක්ෂි පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන්** කරනු ලබන පුද්ගල සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති වලට අනුකූලව එහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් ඒ සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින්, හා එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 26 දරන ශ්‍රී ලංකා අක්ෂි පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා අක්ෂි පදනමේ ආරම්භක සාමාජිකයන් ද ඇතුළුව ඒ සංගමයේ දැනට සිටින සාමාජිකයන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා අක්ෂි පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර එසේ සංස්ථාවක් බවට පත්වේ. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ සහ අලුත් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා අක්ෂි පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(i) අන්ධතාවය නැති කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ii) අන්ධ වූ හෝ අර්ධ වශයෙන් අන්ධ වූ අයට නැවත දෘෂ්ටිය ලබා දීම ;

(iii) යළි දෘෂ්ටිය ලබාදීමට නොහැකි ලෙස අන්ධ වූ හෝ අර්ධ අන්ධ වූ අය පුනරුත්ථාපනය කිරීම ; සහ

(iv) ඉහත සඳහන් කරුණු ඉටුකර ගැනීමට ආනුෂංගික වූ හෝ හිතකර වූ වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

මෙහි සඳහන් කිසිවකින්, කැණීත අපනයනය කිරීමට සංස්ථාවට බලය ලැබෙන්නේ යැයි සලකනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද තත් කාලයෙහි බලපවත්නා වූ ද රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු, එකී රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද පස්දෙනෙකුට නො අඩු සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලැබිය යුතු අතර, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අනුකාරක සභා එකක් හෝ ඊට වැඩි ගණනක් වෙත ඒ මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ උපලේඛනයෙහි නම් සඳහන් කර ඇති සංගමයේ ආරම්භක සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජික ලේඛනය.

5. (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේදී සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් සිටින සෑම තැනැත්තකුගේම සහ මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාවේ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඉන් පසු යථා පරිදි ඇතුළත් කර ගනු ලැබූ සෑම තැනැත්තකුගේම නම් ඇතුළත් වූ සාමාජික නාම ලේඛනයක් පවත්වා ගෙන යෑමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) ඒ නාම ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතුය :—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය සහ වෘත්තිය ;

(ආ) නාම ලේඛනයෙහි සාමාජිකයාගේ නම ඇතුළත් කරනු ලැබූ දිනය ;

(ඇ) සාමාජිකයාගේ සාමාජිකත්වය නතර වූ දිනය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකයන් නෙරපීම ;

(ආ) මණ්ඩලය තෝරා පත් කර ගැනීම, මණ්ඩලය ඉවත් කිරීම, සහ මණ්ඩලයේ කාර්ය කර ගෙන යාම ;

(ඇ) මණ්ඩලයේ කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවලින් බඳවා ගනු ලබන සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම, සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ සංස්ථාව වෙත සලස්වනු ලබන සේවා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට පාරිශ්‍රමික ගෙවීම සහ සංස්ථාවේ වියදම හා අරමුදල් බැහැර කිරීම යන මෙහිදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ;

(ඈ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(3) සංස්ථාව විසින් සාදනු ලැබූ කවර වුවද රීතියක් (1) වන උප වගන්තිය යටතේ ඒ රීතිය සාදන ලද ආකාරයෙන්ම, එවැනිම වූ රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය. එසේ වුව ද එවැනි යම් සංශෝධනයක්, වෙනස් කිරීමක්, එකතු කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක් සඳහා මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන තිබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. තවද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් කළ යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතුය. සංස්ථාවේ මුද්‍රාව තබා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් යථා පරිදි ලියා අත්සන් කළ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

දේපළ දැරීමට සංස්ථාව සතු බලය.

8. මිලට ගැනීමේ, ප්‍රදානයක් වශයෙන් දීමේ, ත්‍යාගයක් වශයෙන් දීමේ හෝ බදු දීමේ යම් සාධන පත්‍රයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ තෙස්තමේන්තු නියාදනයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ ලැබෙන චංචල හෝ නිශ්චල යම් දේපළක් ප්‍රතිලාභී අයිතිකරු වශයෙන්, භාරකරු වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට සහ භාරවලට යටත්වද අදාළ සාධන පත්‍රවල හෝ නියාදනවල අඩංගු කොන්දේසිවලට යටත්වද (භාරවලට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට හා අදාළ සාධන පත්‍රවල හා නියාදනවල විධිවිධානවලට යටත්ව) විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ සහ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ, බැඳ තැබීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාව විසින් දැරිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය.

**9.** මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය තුන් දෙනෙකුගෙන් වන අතර මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් තුන්මසකට වරක් විත් පැවැත්විය යුතුයි. එම රැස්වීම් පැවැත්වීම පිළිබඳව දැන්වීම සති දෙකකට නොඅඩු කාලයකට පෙර මණ්ඩලයේ සාමාජිකයින්ට දිය යුතුය. එසේ වුව ද යටත් පිරිසෙයින් මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් රැස්වීමක දිනයට යටත් පිරිසෙයින් සතියක් තිබියදී කරනු ලබන ඉල්ලීමක් මත සභාපති විසින් අමතර රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ ලේකම්.

**10.** මණ්ඩලයට ලේකම් කෙනෙක් සිටිය යුතු අතර එම ලේකම් භාරයේ මණ්ඩලයට අයත් ලේඛණ, නිල මුද්‍රාවක් ආදිය ඔහුගේ භාරකාරත්වය යටතේ තිබිය යුතුය. ලේකම් තම කාර්යයන් ඉටු කල යුත්තේ සභාපතිගේ මග පෙන්වීම සහ පාලනය යටතේය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**11.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සංගමයට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තෙක් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුබව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

(4(2) වන වගන්තිය)

## උපලේඛනය

### ශ්‍රී ලංකා අක්ෂි පදනමේ ආරම්භක සාමාජිකයෝ

1. වෛද්‍ය කැලිස්ටස් රෙජිනෝල්ඩ් සීමන් එම්. බී. බී. එස්. (ලංකා),
ඩී. ඕ. (ලංඩන්) එෆ්. ආර්. සී. එස්. (එංගලන්තය),
අක්ෂි විශේෂඥ උපදේශක,
මහනුවර, මහරෝගශාලාව.

2. වෛද්‍ය අශෝක බණ්ඩාර අබේසිංහ, එම්. බී. බී. එස්. (ලංකා)
ඩී. ඕ. (ලන්ඩන්) එෆ්. ආර්. සී. එස්. (එංගලන්තය),
අක්ෂි වෛද්‍ය උපදේශක,
මහරෝහල, මහනුවර.

3. වෛද්‍ය අබ්දුල් සමාඩ් ස්මායිල්,
වෛද්‍ය වෘත්තික,
අංක 10, අම්පිටිය පාර,
මහනුවර.

4. චන්ද්‍ර විජේනායක,
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ,
සීමාසහිත සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම
මහනුවර.

5. වෛද්‍ය සුබ්‍රමනියම් නඩේසන්,
වෛද්‍ය වෘත්තික,
අංක 5, මහමායා මාවත,
මහනුවර.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.